# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජනවාරි 2024

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අවශ්‍ය විය. ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා ලබා දී ඇති ප්‍රකාශනයන් සඳහා 'සත්‍ය' හෝ 'අසත්‍ය' සහ ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්න අංකය සමග පිළිතුර උත්තර පොතේ සඳහන් කිරීම අවශ්‍ය විය.

අයදුම්කරුවන් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු වැරදි / දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

අතීත සිද්ධීන්වල ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වය විසින් පාලනය කරනු ලබන වර්තමාන ආර්ථික සම්පත් වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. මේ සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුර ලබා දී තිබුණත් ඇතැමුන් වගකීම් හෝ ආදායම් ලෙස වැරදි උතත්ර ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

නිෂ්පාදනයකට අදාලව භාණ්ඩවල විස්තර ඇතුළත් කර ගැනුම්කරුවකු විසින් පිළියෙල කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල කුමක්ද යන්න අසා තිබුණි. සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් නිවැරදි පිළිතුර ලබා දී තිබුණු අතර බහුතරයක් අයදුම්කරුවන් වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

පෙස්ටල් (PESTEL) විශ්ලේෂණය අනුව ගිණුම්කරණ හා ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑ හැකි ආර්ථික සාධකයක් තේරීමට අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලබා දී තිබුනද සමහර අයදුම්කරුවනට මේ පිළිබදව ප්‍රමාණවත් දැනුමක් නොමැති බව දක්නට ලැබුණි.

**ප්‍රශ්න අංක 1.4**

මෙහි අරමුණ වූයේ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා රු.500,000/- ක බැංකු ණයක් ලබාගැනීම හා සම්බන්ධව ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තේරීමයි. බහුතරයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.5**

මෙම ප්‍රශ්නය මගින් අයදුම්කරුවන්ගේ ගිණුම්කරණ සංකල්පය පිළබද දැනුම පරීක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තරය ලෙස ඓතිහාසික පිරිවැය සංකල්පය ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.6**

වෙළෙඳ ණය ගැතියකුගෙන් මුදල් ලැබීමක් සම්බන්ධයෙන් ගිණුම්කරණ සංකල්පයට වන නිවැරදි බලපෑම විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලබා දී තිබුණ ද, වැඩිවීම සහ ස්කන්ධය වැඩිවීම ලෙස වැරදි උත්තර ද ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.7**

2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය හා මුදල් පොතේ ශේෂය අතර වෙනස සඳහා බලපෑ හැකි හේතුව විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම නිසා නිවැරදි උත්තරය වෙනුවට වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි. නිවැරදි උත්තරය වනුයේ (3) යි.

**ප්‍රශ්න අංක 1.8**

ප්‍රශ්නයේ ඉදිරිපත් කර ඇති තොරතුරු මත පදනම්ව 2024 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ව්‍යාපාරයේ ලාභය ගණනය කර එය තෝරා ගැනීමට අවශ්‍ය විය. සමහරක් අයදුම්කරුවන්ට නිවැරදිව එය ගණනය කර අදාල උත්තරය තෝරා ඉදිරිපත් කිරීමට අපොහොසත් ව ඇත. නිවැරදි උත්තරය වනුයේ (1) යි.

**ප්‍රශ්න අංක 1.9**

බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය අතර වෙනස සඳහා හේතුවක් විය හැකි කාල වෙනසක් වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වෙනුවට වෙනත් වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.10**

ලබා දී ඇති ගනුදෙනුව පදනම් කරගෙන ගණකාධිකාරී විසින් උල්ලංඝනය කර තිබෙන ගිණුම්කරණ සංකල්පය කුමක්ද යන්න විමසා තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තරය වන උපචිත සංකල්පය ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා අයදුම්කරුවන් වෙත ලබා දී ඇති එක් එක් ප්‍රකාශය "සත්‍ය"හෝ "අසත්‍ය" ලෙස උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය. **1.13** ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්න වලට නිවැරදි උත්තර සපයා තිබුණි. **1.13** ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් විකුණුම් දෛනික පොත ගිණුම්කරණ ක්‍රියාවලියේදී ගිණුම්කරණ යෙදවුමක් වීම නිවැරදි බව ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි.

බොහොමයක් අයදුම්කරුවන් විසින් දී ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් වූ වියදමක් ලෙස නිර්වචන පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබීම නිසා නිවැරදි පිළිතුර "සත්‍ය" වෙනුවට "අසත්‍ය" ලෙස ඉදිරිපත් කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර "සත්‍ය" ලෙස ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.16**

බොහොමයක් අයදුම්කරුවන් කාර්යාලයේ පරිහරණය සඳහා පරිගනකයක් මිලදී ගැනීම සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලියවිල්ල ලෙස නිවැරදි උත්තරය වන ජර්නල වව්චරය තෝරා ඉදිරිපත් කර තිබුණි.

**සීමාසහිත ABC සමාගමට** භාණ්ඩ ණයට විකිණීම සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලියවිල්ල ලෙස විකුණුම් ඉන්වොයිසිය හඳුනාගෙන තිබුණි. නමුත් බොහොමයක් අයදුම්කරුවන් වැරදි ලෙස ගැනුම් ඉන්වොයිසිය හඳුනාගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 1.17**

ප්‍රශ්නයේ දී ඇති තොරතුරු පදනම් කරගෙන බොහොමයක් අයදුම්කරුවන්ට 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිවැරදිව ක්ෂය ගණනය කිරීමට අපොහොසත් වී ඇත.

**ප්‍රශ්න අංක 1.18**

බොහොමයක් අයදුම්කරුවන් ජංගම නොවන වත්කම් සඳහා නිවැරදිව උදාහරණ ඉදිරිපත් කර තිබුණි. නමුත් සුළු අයදුම්කරුවන් පිරිසක් ණයගැතියෝ, අවසන් තොගය, බැංකු ණය වැනි වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.19**

ප්‍රශ්නයට අනුව මූල්‍ය තොරතුරුවල සීමාවන් දෙකක් සඳහන් කිරීමට උපදෙස් ලබා දී තිබුණි. සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර, සීමාවන් දක්වනවා වෙනුවට මූල්‍ය තොරතුරු වල ස්වභාවය ද සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.20**

ගැලපුම් සංකල්පය කෙටියෙන් පැහැදිලි කිරීම සඳහා උපදෙස් ලබාදී තිබුණි. සුළු අයදුම්කරුවන් පිරිසක් විසින් මෙයට නිවැරදි අර්ථකතනය ලබා දී තිබුණි. සමහර අයදුම්කරුවන් මෙම සංකල්පයට අදාලව ගැලපුම් සටහන් දක්වා තිබූ අතර, සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීම නිසා උපචිත සංකල්පය සමග පටලවාගෙන උත්තර ලබා දී තිබුණි. එමගින් අයදුම්කරුවන්ට මෙම සංකල්පය පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැති බව පෙනුණි.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න හතරකින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් වෙන් කර ඇත.

(1) සමහර අයදුම්කරුවන්ට නිෂ්පාදන ගිණුම් පිළිබඳ ඇති අවබෝධයක් නොමැති බව පෙනී යයි. ඔවුන් මේ සඳහා විවිධ ආකෘති සහ විවිධ ගණනය කිරීම් භාවිතා කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන්ට ඍජු සහ වක්‍ර පිරිවැය පිළිබඳව නිවැරදි අවබෝධය ලබා ගැනීමට ප්‍රමාණවත් අවබෝධයක් නොමැත.

(3) නොනිමි වැඩ ගැලපීමේ දී අයදුම්කරුවන්ට එය ගලපන්නේ කෙසේද සහ ගැලපිය යුත්තේ කොතැනට ද යන්න පිළිබඳව ඔවුන්ට දැනුමක් නොමැති බව දක්නට ලැබුණි. එසේම බොහොමයක් අයදුම්කරුවන් ධන සහ ඍණ වැරදියට භාවිතා කර තිබුණි.

(4) ප්‍රාථමික පිරිවැය වැරදියට ගලපා ලකුණු අහිමි කරගෙන තිබුණි.

(5) සමහර අයදුම්කරුවන් පොදුකාර්ය වියදම් විභජනය නිවැරදිව ගලපා නොමැත.

(6) ක්ෂය වියදම ගණනය කිරීමේදී වැරදි ගණනාවක් සිදුකර ඇති අතර, එය පොදුකාර්ය වියදම් ලෙස සලකා තිබුණි.

(7) 20% ලාභාන්තිකය වැරදියට ගලපා ඇත.

(8) සමහර අයදුම්කරුවන් නිවැරදි ආකෘතිය භාවිතා කර නොමැත.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ලෙජර් ගිණුම් සැකසීමෙන් පසු ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ දරා ඇති අතර සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයට සාර්ථකව මුහුණ දී ඇත.

අයදුම්කරුවන් විසින් පහත සඳහන් වැරදි සිදු කර ඇතඃ

(1) සමහර අයදුම්කරුවන් ශේෂ පිරික්සුම පිළියෙල කර නොතිබූ අතර පොදු ලෙජර් ගිණුම් සහ ලාභා'ලාභ ප්‍රකාශනය සකස් කර ඇත.

(2) සමහර අයදුම්කරුවන් වෙළඳ ලැබිය යුතු මුදල් සහ වෙළඳ ගෙවිය යුතු මුදල් ලෙජර් ගිණුම් සකස් කිරීමේදී වැරදි සිදු කර ඇති අතර, විකුණුම් සහ ගැනුම් ශේෂ පිරික්සුමට වැරදි ලෙස සටහන් කර ඇත.

(3) සුළු මුදල් වලින් වියදම් කිරීමේදී සහ සුළු මුදල් ශේෂය හඳුනාගැනීමේදී සමහර අයදුම්කරුවන් වැරදි සිදු කර ඇත.

(4) ක්ෂයවීම් නිවැරදිව ගණනය කර නැත.

(5) සමහර අයදුම්කරුවන් හර ශේෂය බැරටත් ,බැර ශේෂය හරටත් සටහන් කර ඇත.

(6) සමහර අයදුම්කරුවන් උපචිත වියදම් නිවැරදිව හඳුනා ගෙන නොමැති අතර ශේෂයන් ද නිවැරදිව හඳුනාගෙන නොමැත.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

වැරදි නිවැරදි කිරීමට සහ අවිනිශ්චිත ගිණුමක් පිළියෙල කිරීමට අදාලව ජර්නල් සටහන් සකස් කිරීමට මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරයි.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සතුටුදායක ලෙස පිළිතුරු සපයා තිබූ අතර, පිළිතුරු පත්‍ර ඇගයීමේදී පහත සඳහන් පොදු දුර්වලතා නිරීක්ෂණය විය.

(1) ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් සකස් කිරීම.

(2) ජර්නල් සටහන් තැබීමේ දී ජර්නල් සටහන් වලට අදාළ හර සහ බැර අගයන් එකිනෙකට මාරු කර සටහන් කිරීම.

(3) ජර්නල් සටහන් තැබීමේ දී පළමුව හර සටහන සහ පසුව බැර සටහන පෙන්විය යුතු වුවත් සමහර අයදුම්කරුවන් පළමුව බැර සටහන ද පසුව හර සටහන ද පෙන්වා තිබුණි.

(4) දෝෂ නිවැරදි කිරීමේදී අවිනිශ්චිත ගිණුම මගින් නිවැරදි කළ යුත්තේ කුමන දෝෂද යන්න නිවැරදිව හඳුනා ගැනීමට සමහර අයදුම්කරුවන් අසමත් වී ඇත.

(5) පොලී වියදම ලෙස ලැබුණු පොලී ආදායම ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි කරන ජර්නල් සටහන් නිවැරදිව සඳහන් කිරීමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් වී ඇත.

(6) කාර්යාලීය උපකරණ මිලදී ගැනීම, කාර්යාලීය වියදමක් ලෙස ගිණුම්ගත කිරීම සඳහා නිවැරදි කිරීම් නිවැරදිව හඳුනාගෙන ඇති නමුත් බොහෝ අයදුම්කරුවන් ප්‍රමාණයක් රු.50,000/- ක ක්ෂයවීම පෙන්වා නොතිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **A** සහ **B** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ. **A කොටස** මගින්ගණුදෙනුවක බලපෑම ගිණුම්කරණ සමීකරණයට බලපාන අයුරු පරීක්ෂා කරන අතර **B කොටස** මගින් බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කරයි.

**A කොටස**

බොහොමයක් අයදුම්කරුවන් ගිණුම්කරණ සමීකරණයට දී ඇති ගනුදෙනුවලින් වන බලපෑම නිවැරදිව හඳුනාගෙන ඇත. නමුත් සමහර අයදුම්කරුවන් ගණුදෙනුවට අදාළ සමීකරණයේ එක් එක් අයිතමයට බලපෑම් නොසලකා සම්පූර්ණ වත්කම් සහ වගකීම් අඩුවීම හෝ වැඩි වීම පමණක් දක්වා තිබුණි.

**B කොටස**

**(a)** මුදල් පාලන ගිණුම (මුදල් පොත) පිළියෙල කිරීමේදී නිරීක්ෂණය වූ පොදු දුර්වලතා:

(1) ගිණුමට බැර කළ යුතු ගනුදෙනු ගිණුමට හර කර තිබූ අතර, ගිණුමට බැර කළ යුතු ගනුදෙනු බැර කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන්ට මුදල් පොත සංශෝධනය කරන්නේද නැතහොත් ලබා දී ඇති ගනුදෙනුවලට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පෙන්විය යුතුද යන්න පිළබඳව නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය. සමහර අයදුම්කරුවන් විසින් පිළියෙල කරන ලද මුදල් පොතේ සියලුම ගනුදෙනු සටහන් කර ඇත.

(3) මුදල් පොතේ ආරම්භක ශේෂය හර ශේෂයක් වුවද, සංශෝධිත මුදල් පොත සකස් කිරීමේදී සමහර අයදුම්කරුවන් බැරට ඇතුලත් කර ඇත.

**(b)** බැංකු සැසඳුම් ප්‍රකාශනය සකස් කිරීමේදී නිරීක්ෂණය වූ පොදු දුර්වලතා:

බැංකු ප්‍රකාශනය සකස් කිරීමේදී අදාල කර ගත යුත්තේ කුමන ආකාරයේ ගනුදෙනුද යන්න පිළිබඳව සිසුන්ට පැහැදිලි අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව මුදල් පොතේ සටහන් කළ යුතු ගණුදෙණු බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ද, බැංකු ප්‍රකාශනයේ සටහන් කළ යුතු ගනුදෙනු මුදල් පොතේ ද සටහන් කර තිබුණි. නිදසුනක් වශයෙන්, මුදල් පොත් ශේෂය සංශෝධනය කිරීම වෙනුවට රු.50,000/- ක ස්ථාවර නියෝග යටතේ බැංකුව විසින් හර කරන ලද මාසික කුලිය ය බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සටහන් කර ඇති බව නිරීක්ෂණය විය.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන සැකසීම පරීක්ෂා කිරීම සඳහා වූ අතර ලකුණු 20 කට **(a)** හා **(b)** යන කොටස් 2 කින් සමන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශනය දි **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ද සකස් කිරීම පරීක්ෂා කරන ලදී. සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. පොදුවේ නිරීක්ෂණය කරන ලද වැරදි සහ අතපසුවීම් පහත පරිදි වේ:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශනය සකස් කිරීම:**

(1) ප්‍රවාහන වියදම් රු.900,000/- විකුණුම් පිරිවැයට එකතු කර ඇත.

(2) රු. 50,000/- ක මුදල බොල් ණය ලෙස සටහන් කර නොතිබුණි.

(3) බොහොමයක් අයදුම්කරුවන් ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ රක්ෂණ වියදම නිවැරදිව ගණනය කර නොමැත.

(4) විදුලිය සහ කාර්යාල කුලිය සඳහා උපචිත වියදම් වර්ෂය සඳහා නියමිත අගයට නිවැරදිව සලකා නොතිබුණි.

(5) කාර්යාලීය උපකරණ මිලදී ගත් දිනය සැලකිල්ලට නොගෙන ක්ෂය වීම සම්පූර්ණ වර්ෂය සඳහා ගණනය කර තිබුණි.

(6) ණය ලබා ගත් දිනය සැලකිල්ලට නොගෙන බැංකු ණය පොළිය ද සම්පූර්ණ වර්ෂය සඳහාම ගණනය කර ඇත.

(7) සමහර අයදුම්කරුවන් දළ ලාභය ගණනය කිරීමේදී ආරම්භක තොගය අවසන් තොගය ලෙසත්, අවසන් තොගය ආරම්භක තොගය ලෙසත් සලකා තිබුණි.

(8) ශේෂ පත්‍රයේ දක්වා තිබූ සංඛ්‍යා දහස් ගනනින් ද, ගැලපුම් සටහන් සම්පූර්ණ සංඛ්‍යාවලින් සලකා ඇත. සමහර අයදුම්කරුවන් දහස් ගණනින් සමහර සංඛ්‍යා පෙන්වා ඇති අතර, සමහර සංඛ්‍යා දහස් ගණනකට ෂලකා නොමැත. එබැවින් ඇතැම් අයදුම්කරුවන් සටහන් කර ඇති සංඛ්‍යා වල සාවද්‍යතාවය හේතුවෙන් ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(9) විස්තීරණ ආදායම් ප්‍රකාශනය නිර්දේශිත ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති අතර බොහොමයක් අයදුම්කරුවන් වියදම් නිවැරදිව වර්ගීකරණය කිරීමට නොදනී.

(10) ව්‍යාපාරයේ නම සමඟ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ලෙස සඳහන් කර නොතිබුණි.

(11) පරිපාලන වියදම්, බෙදාහැරීමේ වියදම් සහ මූල්‍ය වියදම් සඳහා සවිස්තරාත්මක පෙර වැඩ සටහන් සමහර සිසුන් විසින් අමුණා නොතිබුණි.

**(b) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සකස් කිරීම:**

(1) වර්ෂය තුළ කපා හරින ලද බොල් ණය වෙළඳ ලැබිය යුතු මුදල් වලින් අඩු කර නොමැත.

(2) සමහර අයදුම්කරුවන් 2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂයවීම් එකතු නොකර වසර සඳහා ක්ෂයවීම පමණක් සමුච්චිත ක්ෂයවීම් ලෙස පෙන්වා තිබුණි.

(3) කලින් ගෙවූ රක්ෂණය සටහන් කර නොමැත.

(4) ණය ලබා ගත් දිනය සැලකිල්ලට ගෙන නොතිබූ නිසා වැරදි ගණනය කිරීම් හේතුවෙන් උපචිත බැංකු ණය පොලීය වැරදියට ගෙන තිබුණි.

(5) සමහර අයදුම්කරුවන් බැංකු ණය ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

(6) මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය නිර්දේශිත ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති අතර ව්‍යාපාරයේ නම සහ ගිණුම් කාලසීමාව සඳහන් කර නොමැත.

- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.**
2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**
3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**
4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**
5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**
6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න ප්‍රත සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**
7. **මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**
8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, උත්තර සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**
9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

- * * * -